## Scaling Up Nutrition (SUN) සංවිධානය යනු කුමක්ද ?

**(SUN)** යනු 2010 වසරේදී පිහිටවනු ලැබූ, ''සියලුම මිනිසුන්ට ආහාර හා හොඳ පෝෂණයක් ලැබීම සඳහා අයිතියක් ඇත'' යන්න මූලධර්මය කර ගත් සුවිශේෂී ගෝලීය සංවිධානයකි. සියලුම ආකාරයේ මන්දපෝෂණ තත්වයන් තුරන් කිරීම සඳහා සියලු පාර්ශව කරුවන්ගේ සහයෝගයෙන් නව ක්‍රමවේදයක් එයින් ඉදිරිපත් කර ඇත.
එය රටවල්වල රජයේ ප්‍රධානත්වය යටතේ, සිවිල් සමාජ සංවිධාන, එක්සත් ජාතීන්ගේ සංවිධාන, ආධාර සපයන ආයතන, ව්‍යාපාරිකයන් හා පර්යේෂකයන් සමග පෝෂණය වැඩි දියුණු කිරීම සඳහා ගනු ලබන සාමූහික උත්සාහයකි.

**සමස්ත සහාය සපයනු ලබන්නේ,**




**2012 ශ්‍රී ලංකාව Scaling Up Nutrition (SUN) සංවිධානය සමග සම්බන්ධවීම**

ScalingUp NUTRITION
ENGAGE • INSPIRE • INVEST

63 countries are leading a global movement to end malnutrition in all its forms .

## SUN සිවිල් සමාජ ජාලය (SUN CSN)

**(SUN)** සිවිල් සමාජ ජාලය යනු ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ විවිධ ක්ෂේත්‍රයන්හි ක්‍රියාකාරීත්වය දරණ සංවිධානවල එකතුවකි. එනම් කාන්තාවන් බල ගැන්වීම සඳහා වන සංවිධාන, මානුෂීය ආධාර සපයන ආයතන, විවිධ වෘත්තිකයන්ගේ සමිති, ගොවි සංවිධාන, මානව ක්‍රියාකාරීන්ගේ සංවිධාන, පර්යේෂක හා පාරිභෝගිකයන් වැනි වෙනත් විවිධ බහු ආංශිකව ක්‍රියාත්මක වන සංවිධාන වලින් සමන්විත වේ.
පෝෂණය නංවාලීම සඳහා දායක වන ශක්තිමත් සිවිල් සමාජ සංවිධාන ජාලයක් ගොඩනැගීමට අනුබල දීම **SUN CSN** හි කාර්යය වේ. එවැනි සිවිල් සමාජ සන්ධාන ලෝකයේ රටවල් 49ක මේ වන විට පිහිටුවා ඇත.
**SUN CSN** හි මූලික අරමුණ වන්නේ දිගු කාලීනව පවත්වාගෙන යනු ලබන ඵලදායී, කාර්යක්ෂම, බලපෑම් ඇති කිරීමට හැකි විශ්වාසනීය හා ශක්තිමත් ජාතික මට්ටමේ සිවිල් සමාජ සන්ධාන **(CSAs)** රටවල් තුළ ගොඩනැගීමට හා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සහයෝගය ලබා දීමයි.

## SUN ශ්‍රී ලංකා සිවිල් සමාජ සංසදය

**SUN** ශ්‍රී ලංකා සිවිල් සමාජ සංසදය, ජාතික/ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, දිස්ත්‍රික්ක/ප්‍රාදේශීය මට්ටමේ සිවිල් සමාජ සංවිධාන, වෘත්තීය සංවිධාන සහ පෝෂණය නංවාලන වැඩසටහන් සඳහා ක්‍රියාකාරීව සම්බන්ධවන පුද්ගලයන්ගෙන් සමන්විතය.

**SUN** ශ්‍රී ලංකා සිවිල් සමාජ සංසදය, 2014 දී පිහිටුවන ලදී. එය ලියාපදිංචි සහ ස්වාධීන සංවිධානයකි. (GL 2301) **සමාගම් පනත,** 2007 අංක 7)

රටෙහි ජනතාවගේ පෝෂණ තත්වය තිරසාර ලෙස වැඩි දියුණු කිරීම සඳහා දායක වන ඵලදායී, ශක්තිමත් හා හොඳින් සම්බන්ධීකරණය කරන ලද සිවිල් සමාජ ජාලයක් නිර්මාණය කිරීම මෙහි අරමුණයි.

### දැක්ම

**සියලුම ආකාරයේ මන්දපෝෂණ තත්වයන්ගෙන් තොර ලෝකයක්.**

Scaling up Nutrition People's Forum
Civil Society Alliance – Sri Lanka

### මෙහෙවර

**රටෙහි පෝෂණය නංවාලීමට සහ ජාතික හා ගෝලීය ඉලක්ක කරා ළඟා වීමටත්, ගුණාත්මක හා වඩාත් සුදුසු උපක්‍රම හා ක්‍රියාමාර්ග සැලසීම.**

### ඉලක්කය

**ජාතික හා දිස්ත්‍රික්ක මට්ටමින් රටෙහි පෝෂණ මැදිහත්වීම් වෙනුවෙන් පෙනී සිටීම, උද්දේෂණය, නියාමනයට දායක වීම හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා බහු ආංශික සිවිල් සමාජ සන්ධානයක් පවත්වාගෙන යෑම.**

## උපාය මාර්ගික අරමුණු

1. පෝෂණය හා සම්බන්ධ ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශ්වයන්ට වගවීම සඳහා බලපෑම් කිරීමට පාර්ශ්වකරුවන් බලමුළු ගැන්වීම.
2. සුදුසු ඉගෙනුම් ක්‍රියාවලින් හරහා පෝෂණ ප්‍රතිපත්ති හා ඒවායේ භාවිතයන් පිළිබඳව පාර්ශ්වකරුවන්ගේ ධාරිතාවය වැඩි දියුණු කිරීම.
3. විවිධ පාර්ශ්වකරුවන් සහ සිවිල් සමාජ සංවිධාන පෝෂණය, ස්ත්‍රී පුරුෂ භාවය, ආහාර සුරක්ෂිතතාව, උපදේශනය සහ පාලන කටයුතු පිළිබඳව බහු ආංශික ප්‍රවේශයකින් ප්‍රජාව වෙත සමීප වීම සඳහා සිදු කරන මැදිහත්වීම් සක්‍රීය කිරීමට කටයුතු කිරීම.
4. SUN සිවිල් සමාජ ජාලයේ මෙහෙයුම් සහ තිරසාරභාවය ශක්තිමත් කිරීම.

## SUN ශ්‍රී ලංකා සිවිල් සමාජ සන්ධානයේ පාලන ව්‍යුහය

SUN PF
අධ්‍යක්ෂ මණ්ඩලය

SUN PF
විධායක සභාව

තාක්ෂණික
සහයෝගිතා කමිටුව

SUN PF
දිස්ත්‍රික්ක මට්ටමේ
සිවිල් සමාජ සංවිධාන

SUN PF
දිස්ත්‍රික්ක
සම්බන්ධීකාරක

තරුණ
කණ්ඩායම්